## හැඳින්වීම

අද සාමාන්‍ය සමයේ 21 වන ඉරුදිනය යි.

විවිධ භාෂා කථා කරන සියලු ජාතීන් එක්රැස් කිරීමට දෙවි සමිඳුන් වඩින බව පළමු දේව ප්‍රකාශනයෙන් යෙසායා දිවැසිවර තුමන් ප්‍රකාශ කරයි. උන්වහන්සේ යමෙකුට දඬුවම් කරනු ලබන්නේ පීතෘක ප්‍රේමයෙන් යුතුව බවත්, එමගින් හික්මීම ලබන අය දැහැමි, සාමකාමී ජීවිතයක පල අත්කර ගන්නා බවත් දෙවන දේව ප්‍රකාශනයෙන් පැහැදිලි කරයි.

අදට නියමිත සුවිශේෂය තුළින් ගැළවීමේ මාර්ගය වන ක්‍රිස්තුස් වහන්සේ, "පටු දොරෙන් ඇතුළු වන්නට වීර්ය කරන්න." යැයි අප සැමට ආරාධනා කරයි. අවසාන මොහොත වනතුරු නොසිට උන්වහන්සේ සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ඇතිකර ගත යුතු බවද සිහිපත් කර දෙයි.

එබැවින් ජීවනයේ පටු දොරටුවෙන් ඇතුළු වන්නට හැකි වන පිණිස ලෞකිකත්වයේ සියලු ආකාර බරපොදි ඉවතලා, දෙවි සමිඳුන් වෙත පැමිණෙන්නට අපට අවැසි ශුද්ධාත්ම මග පෙන්වීම බහුලව යදිමින්, අප සැම මෙම උතුම් වූ දිව්‍ය යාගයට ගෞරවයෙන් සහභාගී වෙමු.

## විශ්වාසිකයන්ගේ යැදුම්

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.'

1) ආදර දෙවි පියාණනී, ලෞකිකත්වය තුළ මං මුලා නොවෙමින්, ජීවනයේ දොරටුවෙන් ඇතුළුවන්නට වීර්යය වඩන ශුද්ධ වූ සභාව ශුද්ධාත්ම ස්ප්‍රීතුවෙන් බලවත් කර, නිසි මඟ පෙන්වීම සහ දිරිය නිරන්තරයෙන් දානය කරන පිණිස,

2) ආදර දෙවි පියාණනී, ස්වර්ග රාජ්‍යය වෙත අප ගෙනයන මාර්ගය වන ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අපගේ මුළු විශ්වාසය හා බලාපොරොත්තුව තබමින්, උන්වහන්සේ සමඟ ගැඹුරු මිත්‍රත්වයක් ගොඩනගා ගන්නට අප සැමට අවැසි වරම් දානය කරන පිණිස,

3) ආදර දෙවි පියාණනී, අප දේශයේ පාලකයන්ට අවැසි ප්‍රඥාව සහ අවංක බව ලබා දී, ජනතාවගේ ගැටළුවලට සංවේදී වන්නට ද ඒවාට අවශ්‍ය නිසි විසඳුම් සොයන්නට ද ඔවුනට නිබඳව මග පෙන්වන පිණිස,

4) ආදර දෙවි පියාණනි, ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිරෙන කිතුනු ඇදහිල්ලට සහ කිතුනු සදාචාරයට පටහැනි සියලු පාපයේ බලවේගවලින් අප පවුල් ආරක්ෂා කර, සැබෑ කිතුනු වටිනාකම් ගොඩනගා ගන්නට අප සැම මෙහෙයවන පිණිස,